රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 25/2023

මගේ අංකය : EST-01/MISCL/06/0032(II)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.12.15

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2024 වසර - රාජකාරි කටයුතු ඇරඹීම

“සව්මත් අනාගතයකට පෙරවදනක්”යන තේමාව යටතේ, වත්මන් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට අනුකූල නව ආර්ථික ක්‍රමවේදයකට පදනම සපයමින් ගරු ජනාධිපතිතුමන් විසින් 2024 වර්ෂය සඳහා වන අයවැය ඉදිරිපත් කරමින් ගෙන හැර දක්වන ලද කරුණු තුළින්, එළඹෙන 2024 වර්ෂය, රාජ්‍ය සේවයේ නියුතු අප සැමට නවමු අපේක්ෂාවන් ඇති කරනු ඇත.

02. ආර්ථිකයේ ඇති වූ පසුබෑම තුළ වුව ද, රාජ්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය සේවකයින් විසින් දැක් වූ කැපවීම ප්‍රශංසනාත්මකව සිහිපත් කරන අතර, ආර්ථික අර්බුදය ජය ගැනීම සඳහා වන කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් යටතේ දිළිඳුකම පිටුදැකීම, විරැකියාව අඩු කිරීම, දේශීය නිෂ්පාදන වැඩි දියුණු කිරීම සහ විදේශ විනිමය ඉපැයීම ඉහළ දැමීම ආදිය සඳහා රාජ්‍ය සේවයේ ඔබ සැමගේ සක්‍රිය දායකත්වය හා කැපවීම තවදුරටත් අවශ්‍යව ඇත.

03. ඉතිහාසයේ කිසි දිනෙක අත් නොදුටු ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් ඉදිරියට ගමන් කරන මෙම කාල පරිච්ඡේදයෙහි ලෝකයේ ආර්ථික අර්බුදයන්ට මුහුණ දුන් රටවල් එම අභියෝගයන් ජය ගැනීමට හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ පිළිබඳව අධ්‍යයනය කරමින්, මහජන සේවා සැපයීමේ කාර්යක්ෂමතාව තහවුරු කරනු ලබන අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ රාජ්‍ය සේවයට හඳුන්වා දෙමින්, රජයේ වියදම් අඩු කිරීම හා රාජ්‍ය ආදායම් වැඩි කර ගැනීම කෙරෙහි ඔබ සැමගේ අවධානය පෙරටත් වඩා යොමු කළ යුතු ය.

04. 2024 වසරේ රාජකාරි ඇරඹෙන පළමු දිනය වන ජනවාරි මස 01 වන සඳුදා දින සියලු ම රාජ්‍ය සේවකයින්ගේ සහභාගීත්වයෙන් සිය සේවා ස්ථානයන්හි රාජකාරි කටයුතු ආරම්භ කිරීමේ නිල උත්සවය පැවැත්විය යුතු ය. එහි ප්‍රධාන නිල උත්සවය එදින පෙ.ව. 9.00ට ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත් වේ. මහජනතාවට කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවාවක් ලබා දීම සඳහා සමස්ත රාජ්‍ය සේවය ම ඒ සඳහා තිර අදිටනින් කැපවිය යුතු බැවින් ඊට සමගාමීව එදින එම වෙලාවට ම පහත දැක්වෙන වැඩසටහන් ජාතික, පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටම් නියෝජනය කරන සියලු ම රාජ්‍ය ආයතන හා කාර්යාලවල පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන වැඩපිළිවෙල යොදා ගත යුතු වේ.

I. ජාතික ධජය එසවීම හා ජාතික ගීය ගායනා කිරීම.

II. රණවිරුවන් ඇතුළු දේශය වෙනුවෙන් දිවි කැප කළ සියලු ම දෙනා සැමරීම සඳහා විනාඩි දෙකක (02) නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීම.

III. සියලු ම කාර්යය මණ්ඩල සමාජිකයන් තම තමන්ට පහසු භාෂාවකින් තම ස්ථානවල සිට මේ සමඟ එවා ඇති රාජ්‍ය සේවා ප්‍රතිඥාව/ දිවුරුම හඬ නගා කියවීම.

IV. වත්මන් අභියෝග ජය ගැනීම සඳහා හඳුන්වා දී ඇති රාජ්‍ය ප්‍රතිපත්තීන් හා වැඩපිළිවෙල පිළිබඳව හා එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය සේවකයාගේ දායකත්වය පිළිබඳව ඔවුන් අභිප්‍රේරණය කරමින් කෙටි දේශනයක් පැවැත්වීම.

05. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

කේ.ඩී.එන්.රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

දු.ක. - 011-2662340
ෆැක්ස් - 011-2692158
විද්‍යුත් තැපැල - ade-i@pubad.gov.lk

| | | | |
|---|---|---|---|
| පිටපත් -: | 1. | ගරු පළාත් ආණ්ඩුකාරවරුන් | - කාරුණික දැනගැනීම සඳහා |
| | 2. | ජනාධිපති ලේකම් | - අවශ්‍ය කටයුතු සඳහා |
| | 3. | අග්‍රාමාත්‍ය ලේකම් | - අවශ්‍ය කටයුතු සඳහා |
| | 4. | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | - අවශ්‍ය කටයුතු සඳහා |
| | 5. | විගණකාධිපති | - අවශ්‍ය කටයුතු සඳහා |

# රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව/ දිවුරුම

දෙදහස් විසි හතර වර්ෂයේ රාජකාරි අරඹන පළමු වැනි දිනය වන අද දින, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, ලක් වැසි ජනතා අපේක්ෂාවන් යථාර්ථයක් බවට පත් කරන නව වසරක සමාරම්භය සනිටුහන් කරයි.

අදින් ඇරඹෙන නව වසරේ

එකම රටක්, එකම දැයක් තුළ, එක කොඩියක සෙවණේ

එක්සත්ව හා එක්සිත්ව විකසිත වන

සුරක්ෂිත වූ අපගේ මාතෘ භූමිය තුළ

"සව්මත් අනාගතයකට පෙරවදනක්" යන තේමාව පෙරදැරිව

සෞභාග්‍යවත් රාජ්‍යයක් ලෙස

තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගනිමින්

ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකරලීමට,

කාර්යක්ෂම මානව සම්පතක් හිමි

රාජ්‍ය පාලනයක කොටස්කරුවෙකු වශයෙන්,

මම

මහජන මුදලින් වැටුප් ලබන රජයේ සේවකයෙකු ලෙස

රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා

මා වෙත පැවරෙන්නා වූ කාර්යභාරය

කාර්යක්ෂමව,

සඵලදායීව,

තිර අදිටනින් යුතුව,

උපරිම කැපවීමෙන්,

අවංකභාවයෙන්,

මහජනතාවට පක්ෂපාතීව,

සපුරා ඉටු කරන බවට ප්‍රතිඥා දෙමි/ දිවුරුම් දෙමි.